දූරකථන) 2698475
தொலைபேசி) 2698507
Telephone)

ෆැක්ස්) 2692913
பெக்ஸ்) 2694860
Fax)

විද්‍යුත් තැපෑල,)
மின்னஞ்சல் முகவரி) postmaster@health.gov.lk
e-mail)

වෙබ් අඩවිය)
இணையத்தளம்) www.health.gov.lk
website)

සුවසිරිපාය
சுவசிரிபாய
UWASIRIPAYA

මගේ අංකය) CCP/NPTCCD/1/2012
எனது இல)
My No.)

ඔබේ අංකය)
உமது இல)
Your No. :)

දිනය)
திகதி) 2013. 02. 04
Date)

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
Ministry of Health

පොදුවක්‍රලේඛඅංක: 02-36/2013

සෞඛ්‍යඅමාත්‍යාංශය
'සුවසිරිපාය'
පූජ්‍යබද්දේගමවිමලවංශහිමිමාවත
කොළඹ 10

සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
රෝහල් අධ්‍යක්ෂවරුන්/ වෛද්‍ය අධිකාරිවරුන්,
වෛද්‍ය ආයතන ප්‍රධානීන්,
විශේෂිත ව්‍යාපාර අධ්‍යක්ෂවරුන්,
අධ්‍යක්ෂ/ජාතික සෞඛ්‍ය විද්‍යායතනය,
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි/ නගරසභාව,
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරුන්,

ලෝක ක්ෂය රෝග දිනය 2013 මාර්තු 24

වර්ෂ 2013 මාර්තුමස 24 දිනටයෙදී ඇති ලෝක ක්ෂයරෝග දිනයේ මෙවරට තේමාව වී ඇත්තේ **"ක්ෂය රෝගය අනාගත පරපුරට දායාද නොකරමු"** යන්නයි. එමදිනය නිමිත්තකොටගෙන ක්ෂයරෝග නිවාරණය හා ප්‍රතිකාර වැඩ සටහන් ප්‍රවර්ධනය අරමුණුකොටගත් ජාතික, පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශිය සහ ප්‍රජා මට්ටමේ වැඩසටහන්මෙවරද සැලසුම්කොට ක්‍රියාත්මක කිරීමට යෝජිතව ඇත. ජාතික මට්ටමේ වැඩසටහන් සංවිධානය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ක්ෂයරෝග මර්දනහා ළයරෝග පිළිබඳ ජාතික වැඩසටහන මගින් කොළඹදී 23-03-2013 දින පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මෙම වසරේ ලෝක ක්ෂය රෝග දිනය සැමරීමේ ජාතික වැඩසටහනේ ප්‍රධාන ඉලක්කය වන්නේ ක්ෂය රෝගීන් කලින් හඳුනා ගැනීම හා ඉක්මනින් ප්‍රතිකාර කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සෞඛ්‍ය සේවාව සපයන්නන්ගේ කාර්ය භාරය , ශ්‍රී ලංකාවෙන් ක්ෂය රෝගය තුරන් කිරීම හා ඖෂධ ප්‍රතිරෝධී බව වැලැක්වීම උදෙසා ඉතාමත් වැදගත් වන බව ඒත්තු ගැන්වීමයි. ඊට සමගාමීව දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන්ද ලංකාව පුරාම ක්‍රියාත්මක කෙරේ.

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාශ සහ ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාශ මූලිකත්වය ගෙන අදාළ ප්‍රදේශයන්හි වැඩ සටහන් සංවිධානය කරනු ඇත. පසුගිය වසර මෙන්ම මෙම වසරේද ඉහත සඳහන්කළ තේමාවම මුල්කොටගෙන පළාත් සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ කොට්ඨාශ, ප්‍රාදේශිය සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ කොට්ඨාශ, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ සහ රේඛීය අමාත්‍යාංශයට අයත් වෛද්‍ය ආයතන සහ අනෙකුත් සියළුම වෛද්‍ය ආයතන මට්ටමින් සුදුසු වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීමද, සැලසුම් කොට ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් දෛනික සහ දීර්ඝ කාලීන සෞඛ්‍ය අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්වලට කාර්යක්ෂම ලෙස සමෝධානය කිරීමද වැදගත්වේ.

1. වැඩ සටහන් සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී සැලකිල්ලට ගතයුතු කරුණු:

1.1. මෙම වැඩසටහන් ක්ෂයරෝග මර්දන සේවාව ලඝුණාත්මකභාවය වැඩිදියුණු කිරීම පරමාර්ථය කොට ගෙනක්‍රියාත්මක කළයුතුය. මෙහිදී පහත දැක්වෙන කරුණු සඳහා විශේෂ අවධානයක් යොමුකළයුතුය.

- ක්ෂය රෝග ලක්ෂණ සහිත පුද්ගලයන් වැඩිදුර පරීක්ෂණ හා ක්ෂය රෝගීන් ප්‍රතිකාර සඳහා යොමු කරවාගැනීම වැඩි දියුණු කර ගැනීම
- රෝහල්වලටපැමිණෙන ක්ෂය රෝගය යයි සැක කටයුතු රෝගීන් නිසි පරිදි සෙම පටල පරීක්ෂාවන්ට යොමු කිරීම මගින් හඳුනා ගැනෙන ප්‍රමාණය වැඩි කරගැනීම
- ප්‍රතිකාර පැහැර හරින රෝගීන් ප්‍රමාණය අවම කිරීම
- ක්ෂයරෝගය සඳහා වන අවදානම් සාධක හඳුනා ගැනීම සහ ඒ පිළිබඳව දැනුවත්වීම
- ක්ෂය රෝගීන් සමාජයෙන් කොන් කිරීම වැළැක්වීම
- ජනතාව අතර සෞඛ්‍ය සේවාවන් සඳහා යොමු වීමේ සෞඛ්‍ය මත් වර්යාවන් වැඩිදියුණු කර ගැනීම
- පෞද්ගලික හා රාජ්‍ය ආයතනවල සහයෝගය වැඩි දියුණු කිරීම .

1.2. පහත දැක්වෙන අවදානම් කණ්ඩායම් පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුය.

- නාගරික පැල්පත් වාසීන්
- වතු ජනතාව
- ක්ෂය රෝගය සඳහා වැඩි ප්‍රවණතාවයක් ඇති ඉන්දියාව හා අනෙකුත් රටවල පදිංචිව සිට ආපසු පැමිණෙන්නන්
- අවතැන්ව සිට නැවත පදිංචියට යන්නවුන්
- සිරකඳවුරුවල රැඳවියන්
- දියවැඩියා රෝගීන්

- ඉන්ද්‍රිය බද්ධ කළ රෝගීන් ඇතුළුව ප්‍රතිශක්ති ඌණතාවයන් ගෙන් පෙළෙන රෝගීන්
- පිළිකා රෝගීන්
- මත්ද්‍රව්‍ය හා මත්පැන් වලට ඇබ්බැහි වූවන්

1.3. ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සහ දේශපාලනනායකත්වයේද ප්‍රජා නායකයින්ගේද අවධානය ක්ෂයරෝග මර්දන කටයුතු වෙත යොමු කරවාගෙන ඒ සඳහා ඔවුන්ගේ දායකත්වයද හැකි පමණ ලබාගැනීමට කටයුතු කළයුතුය.

1.4. ලෝක ක්ෂය රෝග දිනය යෙදෙන මාර්තු මස 24 දිනට පෙර හා පසු සති දෙකක කාලයක් එනම් මාර්තු 17 දින සිට මාර්තු 31 දින දක්වා ලෝක ක්ෂයරෝග දිනය හා සම්බන්ධව සැලසුම් කොට ක්‍රියාත්මක කරනු ලබන කාර්යයන් සඳහා ප්‍රමුඛ ස්ථානයක් ලබාදීමට කටයුතු සැලැස්විය යුතුය.

1.5. වැඩ සටහන් සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී, ස්වසන රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය නිලධාරීන්, දිස්ත්‍රික් ක්ෂය රෝග මර්දන වෛද්‍ය නිලධාරීන්, ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥයන් හා අදාළ කොට්ඨාශවල සේවයේ නියුතු සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන්, සිය උපරිම සහාය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට සහ ආයතන ප්‍රධානීන්ට ලබාදිය යුතුය.

1.6. වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීමේදී අදාළ දිස්ත්‍රික්කවල පිහිටා ඇති සියළුම රෝහල්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සහ සෞඛ්‍ය ආයතනවල කාර්යමණ්ඩලද දිස්ත්‍රික් ළය චිකිත්සාගාරවල කාර්යය මණ්ඩලය දක්‍රියාකාරීලෙස සහභාගි කරවා ගැනීම අත්‍යවශ්‍යවේ.

1.7. ප්‍රදේශයේ ක්‍රියාත්මක වන ප්‍රජා මූලික සංවිධාන මෙන්ම පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදෙන වෛද්‍යවරුන්ද මෙම වැඩසටහන් සඳහා සුදුසු ලෙසසහභාගි කරවා ගතයුතුය.

2.යෝජනා කරනු ලබන කාර්යයන්:

2.1 osස්ත්‍රික් මට්ටමේ කාර්යයන්

අදාළ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාශයේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ක්ෂය රෝග මර්දන වෛද්‍ය නිලධාරීන් හා එම කාර්ය මණ්ඩලය විසින් සංවිධානය කොට ක්‍රියාත්මක කරනු ලබන දේශන, සාකච්ඡා, සම්මන්ත්‍රණ, තරග, පාගමන්, ප්‍රදර්ශන, වීදි නාට්‍ය ඇතුළු වෙනත් සුදුසු වැඩසටහන්

2.2වෛද්‍ය නිලධාරී කොට්ඨාශ මට්ටමේ වැඩසටහන්

- ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමේ අදාල නිලධාරීන් හා ආයතන සම්බන්ධ කොටගෙන ක්‍රියාත්මක කරනු ලබන දේශන, සාකච්ඡා, සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන්
- ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හා කාර්ය මණ්ඩලය සමග ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්
- යෞවන-යෞවනියන් හාතරුණ-තරුණියන් ඉලක්කකොටගත් යෞවන සමාජ මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

- පාසල් දරුවන් සඳහා සුදුසු වැඩසටහන්
- පාසල් ගුරුවරුන් සහ දෙමව්පියන් ඉලක්කකොට ගත් වැඩසටහන්
- ස්වේච්ඡා සෞඛ්‍ය සේවකයින් සඳහා දේශනස හ සාකච්ඡා
- ග්‍රාමීය මට්ටමේ ක්‍රියාත්මකව පවත්නා ප්‍රජාපාදක සංවිධාන සඳහා සුදුසු වැඩසටහන්
- බන්ධනාගාර රැඳවියන් සහ කාර්යමණ්ඩල ඉලක්ක කොටගත් වැඩසටහන්
- අනෙකුත් රජයේ දෙපාර්තමේන්තු, ආයතන හා පෞද්ගලික අංශය සඳහා වැඩසටහන්
- වැවිලි හා වතුඅංශය සමග වැඩසටහන්
- ආරක්ෂක හමුදා සහ පොලිසිය සමග ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්
- රෝහල් කාර්ය මණ්ඩලය සමග එක්ව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්
- රෝහල් කාර්ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළහැකි, තම කාර්යය මණ්ඩලය සඳහා සුදුසු වැඩසටහන්
- මාතෘ හා ළමා සෞඛ්‍ය, සුවනාරි, පවුල් සංවිධාන වැනි සායනවලට පැමිණෙන මව්වරුන් සහ පියවරුන් සඳහා සුදුසු වැඩසටහන්
- ප්‍රාදේශිය මාධ්‍යවේදීන් ඉලක්කකොටගත් වැඩසටහන්
- ප්‍රදේශයේ වගකිවයුතු ආයතන හා පුද්ගලයින්, ආගමිකනායකයින්, තරුණ හා කාන්තා සංවිධාන සමග කරනු ලබන වැඩසටහන්
- විදෙස්ගතව සිට නැවත පදිංචිය සඳහා පැමිනෙන අය සහ අවතැන්වසිටූ නැවත පදිංචියට යන අය සඳහා විශේෂිත වඩසටහන් (උදා- උපදේශන වැඩසටන්. ෙවද්‍ය සායන)
- වෙනත් සුදුසු වැඩසටහන්

2.3 වෛද්‍ය ආයතන මට්ටමේ කාර්යයන්

- රෝහල් කාර්යය මණ්ඩලය සඳහා දේශන, සාකච්ඡා, වැඩමුළු, සම්මන්ත්‍රණ
- නේවාසික රෝගීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ භාහිර රෝගී අංශය ,රෝගීන් බැලීමට පැමිණෙන අය හා ස්වේච්ඡා සේවකයන් ඉලක්ක කොටගත් වැඩසටහන්
- ටෙලි නාට්‍ය වාර්තාමය වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වෙනත් වැඩසටහන් රූපවාහිනි සහ දුරස්ථ ඇමතුම් කට්ටල හරහා ප්‍රචාරය කිරීමට සැලැස්වීම
- විශේෂිත සායන වලට පැමිණෙන රෝගීන් හා ඔවුන් කැටුව පැමිණෙන අය ඉලක්ක කොටගත් වැඩසටහන්
- ප්‍රාථමික සෞඛ්‍ය කාර්යය මණ්ඩලය සමග එක්ව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

(රෝහල තුල වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී රෝහල සෞඛ්‍ය අධ්‍යාපන අංශය සහ ආසාධන පාලන අංශයේ කාර්ය මණ්ඩලයේ මූලිකත්වය ඉතා වැදගත්ය)

3. සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන්ගේ සේවාඅවශ්‍යතා සඳහා සපයා ඇති ජංගම සෞඛ්‍ය අධ්‍යාපන ඒකකවලට අනුබද්ධව, ජංගම සෞඛ්‍ය අධ්‍යාපන ඒකකයක් ලෝක ක්ෂය රෝග නිවාරණ දිනය හා අදාලව සැලසුම්කොට ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යාපන සන්නිවේදන කාර්යයන් වඩාත් ශක්තිමත්කිරීම සඳහා සුදුසු පරිදි යොදවාගැනීමද අවශ්‍යවේ.

සෑම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශයකම හා රෝහලකම යටත්පිරිසෙයින් එක් විශේෂවැඩසටහනක් සහ තවත් වැඩසටහන් කීපයක් බැගින්වත් ක්‍රියාත්මකකිරීම වැදගත්වේ. ක්ෂේත්‍ර මට්ටමේ වැඩ සටහන් කාර්යක්ෂමව සංවිධානය කිරීමේදී අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ මූලිකත්වය යටතේ කොට්ඨාශ හාර මහජන සෞඛ්‍යපරීක් ෂකවරුන්, මහජන සෞඛ්‍ය හෙද සොයුරියන් හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් එක්ව වැඩසටහන් සංවිධානය කිරීම ඇතුළත් විශේෂ කාර්යභාරයක් ඉටුකරනු ඇතැයිද, සුදුසු වැඩසටහන් හඳුනාගෙන සැලසුම්කොට ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ මෙහෙවරක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විසින් ඉටුකරනු ඇතැයිද අපේක්ෂා කෙරේ.

වෛද්‍ය . පී.ජී. මහීපාල
සෞඛ්‍යසේවාඅධ්‍යක්ෂජනරාල්

වෛද්‍ය පී. ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය,
385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්:

1. ගරු අමාත්‍ය - සෞඛ්‍ය අමාත්‍යාංශය
2. ගරු නියෝජ්‍ය අමාත්‍ය - සෞඛ්‍ය අමාත්‍යාංශය
3. සියළු ගරු පළාත් සෞඛ්‍ය අමාත්‍යවරු
4. ලේකම් - සෞඛ්‍ය අමාත්‍යාංශය
5. අතිරේක ලේකම්වරු - සෞඛ්‍ය අමාත්‍යාංශය
6. සියළු පළාත් සෞඛ්‍ය ලේකම්වරු
7. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය 1 හා 11)
8. අධ්‍යක්ෂ - ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන
9. අධ්‍යක්ෂ - සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය
10. සියළු ස්වසන රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන්
11. සියළුම දිස්ත්‍රික් ක්ෂයරෝගමර්දන වෛද්‍ය නිලධාරීන්

    (සැ.යු.-තම දිස්ත්‍රික්කයේ සිදු කරන ලද වැඩසටහනේ සම්පූර්ණ වාර්තාවක් අධ්‍යක්ෂ - ක්ෂය රෝග මර්දන හා ළයරෝග පිළිබඳ ජාතිකවැඩසටහන වෙතයැවිය යුතුය
12. සියළු සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරිවරුන්